**ජුලී ජේ. චංග් තානාපතිතුමිය**

**IPS සංවත්සරය/සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සමගින් සිදුකළ ග්‍රන්ථ එළිදැක්වීම අවස්ථාවේදී පල කළ අදහස්**

**2023 පෙබරවාරි 27 වැනිදා, සඳුදා ප.ව. 3.30**

**කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලය**

ලබාදුන් උණුසුම් පිළිගැනීමට ස්තුතියි. මේ උත්සවයට සත්කාරකත්වය දක්වන ජෙනරාල් සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සහ, සම්මන්ත්‍රණයේ සංවිධායකයින් වන, KDU හි ක්‍රමෝපායික අධ්‍යයන අංශයේ ආචාර්ය හරින්ද විදානගේ, ආචාර්ය සනත් ද සිල්වා, සහ ලුතිනන් කර්නල් එල්. ආර්. අමරසේකර යන මහත්වරුන්ට අප හැමදෙන මෙම ස්ථානයට ඒකරාශී කිරීමට ඔවුන් දැරූ ඉමහත් වෙහෙස වෙනුවෙන් විශේෂයෙන්ම ස්තුති කරනවා. වඩාත් ආරක්ෂිත සහ සෞභාග්‍යමත් අනාගත ශ්‍රී ලංකාව නියෝජනය කරන පරම්පරාව වන KDU ශිෂ්‍යයින් ද මෙම ස්ථානයේ සිටිනු දැකීමෙන් මා බොහෝ සතුටට පත්වුවා.

සම්භාවනීය අමුත්තනි, සහභාගිවන්නනි, උපකුලපති මේජර් ජෙනරාල් මිලින්ද පීරිස් මහතානෙනි: දැනට වසරකට පමණ පෙර මෙම ස්ථානයේ දී ම අප හමු වී බයිඩන්-හැරිස් පරිපාලනය ඉන්දු-ශාන්තිකර කලාපය ඉදිරියට ගෙන යෑම සඳහා නව මංපෙතක් සකසන අන්දම පිළිබඳව සාකච්ඡා කිරීමට සම්මන්ත්‍රණයක් පැවැත්වුවා. එක්සත් ජනපදයේ ඉන්දු-ශාන්තිකර ක්‍රමෝපාය නොහොත් IPS හි මූලිකාංග පහ තුළ නිදහස් හා විවෘත, සෞභාග්‍යමත්, සම්බන්ධිත, ප්‍රත්‍යස්ථ සහ ආරක්ෂිත ඉන්දු-ශාන්තිඅර කලාපයක් සඳහා අපට ඇති පොදු දැක්ම ගැබ් වී තිබෙන ආකාරය ගැන මා එහිදී පැහැදිලි කළා.

මෙම ක්‍රමෝපාය හමුදා හෝ ආරක්ෂක මිත්‍රසන්ධානයක් නොවූවත්, අපගේ පොදු වටිනාකම් අනතුරේ හෙලන රටවල්වල හැසිරීම දෙස සැලකිලිමත්ව බැලීම ඊට ඇතුළත්වන බව මා සඳහන් කළා. එමෙන්ම මා IPS විස්තර කළේ ඉන්දු-ශාන්තිකර කලාපය සඳහා වන "අපගේ" දැක්ම කියායි. මේ දැක්ම මාගේ රට මෙන්ම ශ්‍රී ලංකාව ද ඇතුළුව මෙම කලාපයේ අනෙකුත් රටවල්වලටද පොදු බව මා විශ්වාස කරනවා. රාජ්‍යතාන්ත්‍රික ධූතමණ්ඩලවල සගයින් ගණනාවක්ම අද මෙම ස්ථානයේ මට දක්නට ලැබෙනවා. බොහෝ රටවලට තමන්ගේම ඉන්දු ශාක්තිකර ක්‍රමෝපායක් තිබෙන අතර, ඒවා අතරේ පොදු වටිනාකම් බොහොමයක් තිබෙනවා. පැහැදිලිවම කියනවා නම්, වැදගත්වන්නේ රටවල් තෝරාගැනීම නොව වටිනාකම් තෝරාගැනීමයි.

IPS හි වර්ෂ පූර්ණ සංවත්සර අවස්ථාවේදී නැවතත් ඔබ සමගින් එක්වන්නට ලැබීමත් වසරකට පෙර පැවැත්වූ එම සම්මන්ත්‍රණයේ වූ විවිධ සාකච්ඡා සහ ලියවිලි ඇතුළත් ප්‍රකාශනයක් එළිදක්වන්නට හැකිවීමත් ඉතාමත් වටිනා බව මා සලකනවා. මෙම ග්‍රන්ථයේ නාමය වන "ඉන්දු-ශාන්තිකරය සඳහා

පොදු දැක්මක්" යන්නෙන්ම පිළිබිඹු වන්නේ සමස්ථ ඉන්දු-ශාන්තිකර කලාපයම සඳහා දැක්මක් IPS තුළ ඇතුළත් වන බවයි. සම්මන්ත්‍රණය අවස්ථාවේ පල වූ අදහස්වලට අමතරව, ගිය වසරේ එම මණ්ඩල සාකච්ඡාවලට සම්බන්ධ වූ විද්වතුන් විසින් සම්පාදිත ඇතැම් ප්‍රතිපත්ති ලියවිලි ද මෙම ග්‍රන්ථයට ඇතුළත් කර තිබෙනවා.

මේ ලියවිලිවල ඇතුළත් වී තිබෙන්නේ ඒ ඒ ලේඛකයාගේ අදහස් මිස සෑමවිටකම ඒවා හරහා එක්සත් ජනපදයේ හෝ KDU හි අදහස් නිරූපණය නොවන බව මතක් කරමින් ම, එම ලියවිලි කිහිපයකින් කරුණු කිහිපයක් උපුටා දක්වන්නට මා කැමතියි.

"21 වැනි සියවසේ සම්බන්ධවීම සඳහා වන ප්‍රධානතම වේදිකාවක්" වශයෙන් ඉන්දු ශාන්තිකර කලාපය විස්තර කරන චූලනී අත්තනායක තම ලිපියේ ඉන්දු ශාන්තිකර කලාපයේ වැදගත්කම අවධාරණය කරනවා. ගිය වසරේ ප්‍රකාශිත එක්සත් ජනපදයේ ජාතික ආරක්ෂක ක්‍රමෝපාය තුළ ද මේ කරුණ ම සඳහන් වන්නේ "ඉන්දු පැසිෆික් කලාපය ලෝකයේ ආර්ථික වර්ධනයෙන් වැඩි කොටසක් පෝෂණය කරන අතර 21 වැනි සියවසේ භූදේශපාලනයෙහි එය කේන්ද්‍රස්ථානයක් වනු ඇත... ලෝකයේ අන් කිසිදු කලාපයක් මෙතරම් වැදගත් නොවනු ඇත." යනුවෙන්.

ඉන්දු-ශාන්තිකර කලාපයේ සිදුවන දේවල් සමස්ථ ලෝකයටම බලපාන අතර, විශේෂයෙන්ම එය ශ්‍රී ලංකාවට බලපානවා. අප හැමදෙනාම දන්නා පරිදි ශ්‍රී ලංකාව පිහිටා තිබෙන්නේ ලෝකයේ කාර්යබහුලම නැව් ගමන්මාර්ග ගණනාවක් ආසන්නයේයි. මෙය සුළුපටු වගකීමක් නොවේ. ගනේෂන් විග්නරාජා තම ලිපියේ පවසන අන්දමට "ලෝකය තුළ ආසියාවේ නැගී ඒමත් සමගින්, ලෝකයේ කාර්යබහුලම නැගෙනහිර-බටහිර වෙළඳ සහ කාර්මික කොරිඩෝවක් බවට ඉන්දියානු සාගරය පරිවර්තනය වීම 21 වැනි සියවසේ සංවර්ධන සාර්ථකත්වය පිළිබඳ කථාන්දරයකි. ඉන්දියානු සාගරයේ සිදුවන සමුද්‍රීය වෙළඳ කටයුතුවලට ගෝලීය තෙල් තොග ප්‍රවාහනයෙන් තුනෙන් දෙකක ප්‍රමාණයක් ද ගෝලීය භාණ්ඩ තොග වලින් තුනෙන් එකක් ද ඇතුළත් වේ."

IPS හි වර්ෂ පූර්ණ සංවත්සරයට අමතරව අප මේ වසරේ එක්සත් ජනපදයත් ශ්‍රී ලංකාවත් අතර රාජතාන්ත්‍රික සබඳතා ඇති වී 75 වසරක් සැපිරීම ද සමරනවා. අප දෙරට අතර ඇති සබඳතාවය පුළුල් සහ ගැඹුරු සබඳතාවයක් වන අතර, එහි මධ්‍යයෙහි ඇත්තේ ජනතාව, ප්‍රගතිය සහ හවුල්කාරීත්වය සඳහා අපේ ඇති පොදු කැපවීමයි. ජෝර්ජ් කුක් තම ලිපියේ අවධාරණය කරන අන්දමට මෙම සම්බන්ධතාවයට පොදු ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් කෙරෙහි කැපවීම ද ඇතුළත් වනවා. "එ.ජ.-ශ්‍රී ලංකා සබඳතාවල අනාගතය පැහැදිලිවම රඳී ඇත්තේ ප්‍රජාතන්ත්‍රවාදී තලය තුළයි. දෙරටේම පද්ධතීන් තුළ දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් මුල්බැසගෙන තිබීම දෙරටටම වාසියක් වන අතර සෑමවිටකම ඒවා මත රඳා පැවතිය යුතු වේ" යනුවෙන් කුක් සඳහන් කරනවා. ඇතැම් අවස්ථාවලදී ප්‍රජාතන්ත්‍රවාදය අපිළිවෙළ ගතියක් පෙන්නුම් කළත්, ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික පදනම වන සංවරණ හා තුලන, ස්වාධීන ආයතන සහ නිදහස් හා සාධාරණ මැතිවරණ හරහා රටක් ශක්තිමත් කරවනවා.

මේ මාසයේ මුලදී, රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ඉහළතම නිලයක් හොබවන නිලධාරිනියක වන දේශපාලන කටයුතු පිළිබඳ උපලේකම් වික්ටෝරියා නුලන්ඩ් මහත්මිය සාකච්ඡා සඳහා ශ්‍රී ලංකාවට පැමිණියා. එහිදී දෙරටටම පොදු, පුළුල් පරාසයක ලැදියාවන් සම්බන්ධයෙන් ද්විපාර්ශවීය හවුල්කාරත්වය සඳහා කැපවීම අපි යළි ශක්තිමත් කළා.

2022 වර්ෂයේ පමණක් එක්සත් ජනපදය ඉන්දු-ශාන්තිකර කලාපයට විදේශ ආධාර ලබාදීම සඳහා ඩොලර් බිලියන 2ඉක්මවන ප්‍රමාණයක් ආයෝජනය කළ අතර තවත් බිලියන ගණනක් 2023 දී වෙන් කරන්නට බලාපොරොත්තු වනවා. මෙය, 2018 සිට අප ඉන්දු-ශාන්තිකර කලාපයේ ආයෝජනය කළ මුළුමුදල වන ඩොලර් බිලියන 11.5ට අමතරවයි. විශේෂයෙන්ම, ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශක්තිමත් කිරීමටත්, පාසලේදී ගැනීමට දරුවන්ට ආහාර ඇති බව සහතික කරගැනීමටත්, සාර්ථක භෝග වගාවක් සඳහා ගොවීන්ට පොහොර ලැබෙන බව සහතික කරගැනීමටත් පසුගිය ජූනි මාසයේ සිට මේ වනවිට එක්සත් ජනපදය අළුතින් ඇ. ඩොලර් මිලියන 270ක ආධාර පිළිබඳව නිවේදනය කළා. ඉදිරි සති වලදී, එනම් යල කන්නය එළඹීමට පෙර මෙරටට එවන ටීස්පී පොහොර තොගයක් භාරගැනීමට අප සූදානමින් පසුවනවා. විවෘත හා නිදහස්, සෞභාග්‍යමත්, සම්බන්ධිත, ප්‍රත්‍යස්ථ සහ ආරක්ෂිත ඉන්දු-ශාන්තිකර කලාපයක් සඳහා අපේ පොදු දැක්ම සාක්ෂාත් කරගන්නට අප විසින් සිදුකරන දේවල් පිළිබඳව පොදුවේ යමක් කියන්නට මා මිනිත්තු කිහිපයක් ගන්නට කැමතියි.

"නිදහස් හා විවෘත" ඉන්දු-ශාන්තිකර කලාපයක් යනු නෞකාවලට විවෘත සමුද්‍රයේ ගමනාගමනය කිරීමට හා තරණය කිරීමට නිදහස සහිත තැනක් බව මා වසරකට පෙර සඳහන් කළා. මා කලින් සඳහන් කළ අන්දමට මෙය ශ්‍රී ලංකාවට විශේෂයෙන් වැදගත්වන්නේ ශ්‍රී ලංකාවේ පිහිටීම නිසායි. නිදහසේ සමුද්‍ර තරණය සඳහා හැකියාව තිබීම ශ්‍රී ලංකාවට තම භූක්‍රමෝපායික පිහිටීමෙන් ඵලදායි ලෙස ප්‍රයෝජනයක් ගැනීමට මග සලසන අතර, මේ කලාපයේ කාර්ය බහුලම වරායක් බවට පත්වීමට එය කොළඹ වරායට උපකාරී වී තිබෙනවා. සමුද්‍ර තරණය සඳහා නිදහස ප්‍රවර්ධනය කරන්නට එක්සත් ජනපදය විසින් කටයුතු කිරීම තුළින් නිදහස් හා විවෘත ඉන්දු-ශාන්තිකර කලාපයක් ඇතිවීම ශ්‍රී ලංකාවේ ලැදියාවන්ට සෘජුවම සමපාත වන්නේ එනිසායි.

නිදහස යනු "අපගේ අනාගතය අපටම ලිවීමට හැකි සහ අපේ ප්‍රජාවේත් අපේ රටවලත් සිදුවියයුතු කුමක්දැයි අපටම කිවහැකි වීම" යැයි බ්ලින්කන් ලේකම්තුමා විස්තර කර තිබෙන බව ගිය වසරේ සම්මන්ත්‍රණයේදී මා සඳහන් කළා. මොස්කව් නුවරින් නිරර්ථක ලෙස යුක්රේනය ආක්‍රමණය කිරීමෙන් නිදහස හා ස්වෛරීත්වය පිළිබඳව මේ මූලිකතම මූලධර්මය උල්ලංඝනය කළ ආකාරය, ගත වූ වර්ෂය තුළ අප දුටුවා. මේ කුරිරු ආක්‍රමණශීලී ක්‍රියාවට එරෙහිව යුක්රේන ජනතාව සමගින් සිටගැනීමට එක්සත් ජනපදය කටයුතු කළේ සහ ඉදිරියටත් එසේ කරනු ඇත්තේ එනිසායි.

ගතවූ වර්ෂයේ එක්සත් ජනපදය ඉන්දු-ශාන්තිකරය මුළුල්ලේ සිටින විවිධ හවුල්කරුවන් සමගින් සමීපයෙන්ම වැඩ කරමින් කලාපය මුළුල්ලේ ප්‍රජාතන්ත්‍රවාදය, නීතියේ ආධිපත්‍ය, නිදහස් සහ විවෘත

මාධ්‍ය, සහ ශක්තිමත් සිවිල් සමාජ සංවිධාන, පාසැල් හා විශ්වවිද්‍යාල, හා ජනතාවක් ප්‍රවර්ධනය කිරීමෙන් මෙම කලාපය විවෘත සහ ප්‍රවේශවිය හැකි කලාපයක් වශයෙන් පවතින බව සහතික කරගැනීමට කටයුතු කළා.

ඉන්දු-ශාන්තිකරයේ සෞභාග්‍ය වර්ධනය කිරීම ද අපගේ ඉන්දු-ශාන්ත්කර ක්‍රමෝපායට ඇතුළත් වනවා. ශ්‍රී ලංකාව වර්තමානයේ මුහුණ දී සිටින ආර්ථික අභියෝග සලකා බලන කල, සෞභාග්‍යමත් ඉන්දු-ශාන්තිකර කලාපයක් ගොඩනැංවීම සඳහා සැමදෙනා එක්ව වැඩ කිරීම අන් කවරදාකටත් වඩා අද වැදගත් වන්නේ යැයි හැමදෙනා එකඟ වනු ඇතැයි මා සිතනවා. එමෙන්ම, මනා ආර්ථික පාලනය මනා දේශපාලනමය පාලනය සමගින් අත්වැල් බැඳගෙන යන්නක් බවත් අපට සිහිවනවා. එනිසා, එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ හවුල්කරුවා වන බවත්, මේ දුෂ්කර කාලය තරණය කරනා අතරේ අප ශ්‍රී ලංකාව සමගින් සිටින බවත් මට පැහැදිලිවම කිව හැකියි.

එක්සත් ජනපදය යනු තනි රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ විශාලතම අපනයන වෙළඳපල වන අතර, වාර්ෂිකව ශ්‍රී ලංකාව අපනයනය කරන ඩොලර් බිලියන 119ක භාණ්ඩ අතරින් බිලියන 2.8ක් පමණ සඳහා වගකියන්නේ එක්සත් ජනපදයයි. මේ අගය, කෝවිඩ් සමය තුළ පවා ද ඇතුළුව, වර්ෂයෙන් වර්ෂයට වර්ධනය වනවා. එක්සත් ජනපදයට අපනයනය කරන ශ්‍රී ලාංකික සමාගම් මෙරට රැකියා 180,000ක් පමණ සපයා දී තිබෙනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහය ලබාගැනීමේ ක්‍රියාවලියෙහි ඉදිරියට ගමන්කරන ශ්‍රී ලංකාවට සහයෝගය ලබාදීම සඳහා එක්සත් ජනපදය කැපවී සිටින්නේ එනිසායි. ශ්‍රී ලංකාවට නැවතත් ආර්ථිකය යථා තත්වයට පත්කරගැනීමේ මාර්ගයට අවතීර්ණ වීමට උපකාර කිරීම සඳහා, ශ්‍රී ලංකාවේ අනාගතය වෙනුවෙනු ආයෝජන සිදුකළ ඒ ප්‍රධාන රටවල් සියල්ලෙන්ම නිශ්චිත සහ විශ්වසනීය මූල්‍යාලරණ සහතික පිළිබඳ කැපවීම් ඉතා ඉක්මනින් අපට දැකගන්නට ලැබේවා කියා මා ප්‍රාර්ථනා කරනවා.

ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් සහ ව්‍යවසායකත්ව හැකියාවන් හරහා විශාල ආර්ථික විභවයක් නිර්මාණය කෙරෙතත්, එම විභවයෙන් පූර්ණ වශයෙන් ඵල නෙලාගැනීමට නම්, විනිවිදභාවයෙන් සහ පූර්ණ වශයෙන් සර්වග්‍රාහී ව්‍යාපාර පරිසරයක් තිබීම ඉතාමත් වැදගත් වන බව ද මා මෙහිදි සඳහන් කරනවා. මේ අවස්ථාවේ කඩිනමින් ආර්ථිකය යථා තත්වයට පත් කරගැනීමෙන් ඔබ්බට, මෙරට දීර්ඝ කල්පවත්නා සෞභාග්‍යක් උදා කරගැනීම රඳා පවතින්නේ රටේ දීර්ඝ කාලීන ආයෝජන පරිසරය මතයි. එක්සත් ජනපද සමාගම් සහ විදේශ සමාගම් නිතරම මට කියන්නේ මෙයයි. රාජ්‍ය මූල්‍ය හා මූල්‍ය ආයතන ශක්තිමත් කිරීම, තිරසාර සහ සර්වග්‍රාහී ආර්ථික වර්ධනය පෝෂණය කිරීම, සහ ජාත්‍යන්තර ආයෝජන වැඩිවැඩියෙන් ආකර්ෂණය කරගැනීමට උදවු දීම වැනි දෑ සඳහා සහය ලබාදෙන ප්‍රතිපත්තිවලට ද එක්සත් ජනපදය කැපවී සිටින්නේ එනිසායි. වඩාත් පුළුල් වශයෙන් ගතහොත්, ගිය වසරේ අප මෙම කලාපයේ අපගේ ආර්ථික සම්බන්ධවීම් වඩාත් වර්ධනය කරමින් කලාපයේ සෞභාග්‍ය වර්ධනය කිරීමට සහය

දීමටත්, ඉන්දු-ශාන්තිකර ආර්ථික රාමුව එළිදැක්වීම හරහා ආර්ථික සහයෝගීතාවය සඳහා සාධනීය ආකෘතියක් ලබාදීමටත් කටයුතු කළා. 2022 මැයි මාසයේ බයිඩන් ජනාධිපතිතුමා ගෝලීය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 40ක් නියෝජනය කරන කලාපීය හවුල්කරුවන් 13 දෙනෙකු සමගින් සැපයුම් දාමවල ප්‍රත්‍යාස්ථභාවය, ඩිජිටල් පරිවර්තනය, සහ පවිත්‍ර බලශක්තිය කරා මාරුවීම ඇතුළුව, ආර්ථික සහයෝගය සහ 21 වැනි සියවසේ මූලික අභියෝග ආමන්ත්‍රණය සඳහා සාධනීය සහතිකවීමක් ඇතිකිරීම සඳහා IPEF එළිදැක්වූවා.

එක්සත් ජනපදයත් ජපානයත් එක් වී අතථ්‍ය (virtual) ක්‍රමයට සහභාගිවන්නන් 1000කට වැඩි පිරිසක් ද භෞතිකව සහභාගි වූ ජපානයේ ටෝකියෝ නුවර ව්‍යාපාර ලොව ප්‍රමුඛයින් හා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සැදුම්ලත් 270ක් ද ඒකරාශී කරමින් පස්වැනි ඉන්දු-ශාන්තිකර ව්‍යාපාර සංසදය පැවැත්වූවා. සම්බන්ධතා හා හවුල්කාරීත්ව ගොඩනැංවීමත්, යහපරිව බෙදාහදා ගැනීමත්, සැපයුම්දාම, පවිත්‍ර බලශක්තිය හා ඩිජිටල් යටිතල පහසුකම් වැනි ගැටළු සම්බන්ධයෙන් නව්‍ය චින්තනය උනන්දු කරවීම සඳහා එම සංසදය පවත්වනු ලැබුවා. එමෙන්ම, මේ වසරේ අග භාගයේදී "සියළුදෙනාටම ප්‍රත්‍යාස්ථ සහ තිරසාර අනාගතයක්" යන තේමාවෙන් පවත්වන APEC සමුළුව සඳහා ද එක්සත් ජනපදය සත්කාරකත්වය දක්වනු ඇති. එය, මෙම කලාපය කෝවිඩ් 19 වසංගතයෙන් නැගී සිටීමේදී ප්‍රායෝගික ආර්ථික ප්‍රතිපත්ති සංවර්ධනය කිරීමත් සැපයුම්දාමවල කම්පන, අභියෝග මධ්‍යයේ පසුවන සෞඛ්‍ය පද්ධතීන්, ආහාර අනාරක්ෂිතතාවය, සහ දේශගුණ විපර්යාස සම්බන්ධයෙන් සාමූහිකව ආමන්ත්‍රණය කිරීමට දරන වෑයමක් වනවා.

ඉන්දු-ශාන්තිකර කලාපය තුළ හා ඉන් පිටත සම්බන්ධතා ගොඩනංවාගැනීම ආර්ථික වර්ධනය සඳහා වැදගත් වනවා. කෙසේනමුත් එක්සත් ජනපදය සහ ශ්‍රී ලංකාව අතර සම්බන්ධතා හුදෙක් ආර්ථික සම්බන්ධතාවලට වඩා බොහෝ ගැඹුරට දිවෙනවා. 75 වසරක් තිස්සේ අප දෙරට අතරේ ශක්තිමත් සම්බන්ධතාවයක් පවතිනවා. ඒ කාලයෙන් වසර 70ක්ම මුළුල්ලේ එ.ජ.-ශ්‍රී ලංකා ෆුල්බ්‍රයිට් කොමිසම ක්‍රියාත්මක වී ඇති අතර, ජ්‍යෙෂ්ඨ පර්යේෂකයින්, මහාචාර්යවරුන්, සහ සිසුන් 1,100 ඉක්මවන පිරිසකට අධ්‍යයන හුවමාරු යටතේ දෙරට අතරේ සංචාරය කිරීමට ඉන් ඉඩ සැලසී තිබෙනවා. තවද, වසර 60ක් තිස්සේ USAID ශ්‍රී ලංකාවේ ජනතාවට ඔවුන්ගේ රටෙහි සංවර්ධනය සඳහා මගපාදා ගැනීම පිණිස එ.ජ. ආධාර මුදල් වශයෙන් ඩොලර් බිලියන 2කට වඩා ලබා දී තිබෙනවා. අප ශ්‍රී ලංකාවේ මීළඟ පරම්පරාවේ නායකයින්ට ද පුහුණු ලබාදෙනවා. දැනට සති කිහිපයකට කලින් රටපුරා සිටින අපගේ තරුණ සංසද සාමාජිකයින් එකිනෙකා හමුවූ අතර රට පුරා පාසල් යන වයසේ ළමුන්ට ඉංග්‍රීසි භාෂා පුහුණුව ලබාදීම ඇතුළුව තවත් බොහෝදේ ඒ අතරට ඇතුළත් වනවා.

Partners in the Blue Pacific සංසදය ආරම්භ කිරීම, ASEAN රටවල් සමගින් අපේ සබඳතාවය වර්ධනය කිරීම, පස්වැනි ඉන්දු-ශාන්තිකර ව්‍යාපාර සංසදය පැවැත්වීමට ජපානය සමගින් අත්වැල් බැඳ ගැනීම, සහ දිර්ඝ කාලයක් තිස්සේ අපේ හවුල්කරුවන් සමගින් හා මිත්‍රසගයින් සමගින් පවතින සබඳතා හරහා එක්ව

වැඩ කිරීමත්, Quad සහ U.S.-EU Indo-Pacific Consultations වැනි නව ආකෘතිවල සම්බන්ධතා ඇතිකරගැනීමත් හරහා මෙම කලාපය තුළ හා ඉන් පිටත සම්බන්ධතා ගොඩනංවාගැනීමටත්, බහු-රාජ්‍ය සංවිධාන සමග ඇති සම්බන්ධතා ශක්තිමත් කරගනිමින් නව සබඳතා ඇතිකර ගැනීමටත් අප පොදුවේ කටයුතු කර තිබෙනවා.

පසුගිය වසර කිහිපයේ අප ඉගෙනගත් පාඩම නම් "ප්‍රත්‍යස්ථතාවය" ගොඩනගා ගැනීමට අප සහයෝගයෙන් කටයුතු කළයුතු බවයි. දේශගුණ විපර්යාසයන් හරහා එල්ලවන ගෝලීය අභියෝගය හමුවේ අප හැමදෙනාම එක්ව වැඩ කිරීම අවශ්‍ය වනවා. තිරසාර, සර්වග්‍රාහී, වෙළඳපල පදනම් කරගත් වෘද්ධිය කෙරෙහි දායක වියහැකි ආකාරයෙන් දේශගුණ විපර්යාසවලට අනුහුරුවීම සඳහා ශ්‍රී ලංකාවට ඇති හැකියාව වැඩිකරන සහ පුනර්ජනනීය බලශක්ති භාවිතට දිරිගන්වන අන්දමේ වැඩසටහන් සඳහා එක්සත් ජනපදය ශ්‍රී ලංකාවත් සමගින් හවුල්වී ඇත්තේ එනිසායි.

සුරක්ෂිත සහ ඵලදායී කෝවිඩ්-19 එන්නත් මාත්‍රා මිලියන 274ක් ලබාදීම හරහා සහ Indo-U.S. Vaccine Action Program වැඩසටහන හා ASEAN Emergency Operations Center වෙත සහය ලබාදීම වැනි ඒකාබද්ධ මුලපිරීම් හරහා අනාගතයේ ඇතිවිය හැකි සෞඛ්‍ය හදිසි අවස්ථාවලට අපගේ හවුල්කරුවන් සූදානම් කිරීම හරහා අප ප්‍රත්‍යස්ථභාවය නොහොත් ඔරොත්තුදෙනසුළු භාවය ප්‍රවර්ධනය කර තිබෙනවා. එමෙන්ම, පවිත්‍ර බලශක්තිය, පවිත්‍ර වාතාශ්‍රය සහ දේශගුණ ප්‍රත්‍යස්ථභාවය සම්බන්ධයෙන් සිදුකෙරෙන ව්‍යාපෘති සඳහා කලාපය මුළුල්ලේම ඩොලර් බිලියන ගණනක් යෙදවීමට අප කටයුතු කර තිබෙනවා. Clean Power Asia, the U.S.-India Strategic Clean Energy Partnership සහ South Asia Regional Initiative for Energy වැනි ව්‍යාපෘති ඊට ඇතුළත් වනවා.

ශක්තිමත් ආරක්ෂක හවුල්කාරිත්වය අපගේ ද්විපාර්ශ්වික සබඳතාවයේ ප්‍රධාන අංගයක් වී තිබෙනවා. තර්ජන සහ අභියෝග වර්ධනය වන විට ඊට සරිලන සේ අපගේ ආරක්ෂක ප්‍රවේශය ද පරිණාමය විය යුතුයි. එහෙත්, අප කුමන අභියෝගවලට මුහුණ දුන්නද, අපගේ විශාලතම ශක්තිය වන්නේ, ඉන්දු-පැසිෆික් දැක්මට සහාය වන අපගේ සන්ධාන සහ හවුල්කාරිත්වයයි. අප එක්ව අභ්‍යාසයක් පවත්වන සෑම අවස්ථාවකම, සමුද්‍ර ආරක්ෂාව, ආපදා සහන සහ සැපයුම් වැනි විෂය කරුණු පිළිබඳ විශේෂඥයින් හුවමාරු කර ගැනීම හෝ තීරණාත්මක උපකරණ සහ වේදිකා මාරු කරන සෑම අවස්ථාවකම අපගේ ද්විපාර්ශ්වික සබඳතාව ශක්තිමත් වනවා.

පසුගිය මාසයේ අපි Cooperation Afloat Readiness and Training, නොහොත් CARAT අභ්‍යාසය පැවැත්වුවා. CARAT යනු එක්සත් ජනපදය සහ ශ්‍රී ලංකාව අතර විශාලතම ද්විපාර්ශ්වික මිලිටරි මැදිහත්වීම වන අතර එක්සත් ජනපදයේ අප ඉන්දියානු සාගර කලාපයේ ආරක්ෂාවට තීරණාත්මක යැයි සලකන එකක් වනවා. ශ්‍රී ලංකා නාවික හමුදාවට අයත් ගජබාහු සහ විජයබාහු යන නෞකා මෙම අභ්‍යාසයට සහභාගී වීම දැකීමෙන් මම ඇත්තෙන්ම සතුටට පත් වුවා. මෙම නෞකා දෙකම එක්සත් ජනපද පරිත්‍යාග

වන අතර දැන් ඒවා සාඩම්බරයෙන් ශ්‍රී ලාංකිකයින් අතට පත්වී තිබෙනවා. ශ්‍රී ලංකා නාවික හමුදා ඉතිහාසයේ දීර්ඝතම මුහුදු ගමනකින් එය මෙරටට සැපත් වූවායින් පසුව පසුගිය නොවැම්බරයේ අලංකාර උත්සවයකින් පසුව විජයබාහු නෞකාව භාර දෙනු ලැබුවා. ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ආරක්‍ෂාව සහ ස්වෛරීභාවය සඳහා අපගේ කැපවීමට එය සාක්ෂියක් වනවා.

අප අතර සබඳතා තවත් ගැඹුරු කිරීමට CARAT දායක වූ ආකාරය දකින්නට ලැබීම විශිෂ්ටයි. උදාරහණයක් වශයෙන්, ආපදා අවස්ථාවලදී ශ්‍රී ලාංකික පුරවැසියන්ට පිරිසිදු පානීය ජලය ලබාගත හැකිවීම සඳහා අප දෙරට හමුදාවන් ජල පිරිපහදු පුහුණුවක් සිදුකළා. එමෙන්ම, දෙරටේම කාර්යමණ්ඩලය එක්ව හමුදා ක්ෂේත්‍රය තුළ කාන්තාවන් බලපෑමක් ඇතිකරන ආකාරය සම්බන්ධයෙන් සාකච්ඡා කළ කාන්තාවන්, සාමය සහ ආරක්ෂාව පිළිබඳ සාකච්ඡාවක් අප පැවැත්වූවා.

ආරක්ෂාව සහ දේශගුණ විපර්යාස අතරේ ඇති සම්බන්ධතාවය සාකච්ඡාවට ගනිමින් මේ වැදගත් ක්ෂේත්‍රයේ අපට වැඩි වැඩියෙන් එක්ව වැඩකළ හැකි ආකාර ගැන සාකච්ඡා කිරීම සඳහා පාරිසරික ආරක්ෂක සම්මේලනයක් පැවැත්වීමට මේ වසරේ අගදී අප ශ්‍රී ලංකාව සමගින් වැඩකරන බව අපේ ආරක්ෂක සබඳතාවයේ ගැඹුර පිළිබිඹු කිරීම සඳහා මා මේ අවස්ථාවේ සඳහන් කරන්නට කැමතියි.

සියවසකින් හතරෙන් තුනක කාලයක් තිස්සේ අප දෙරට අතරේ මේ සම්බන්ධතාවය පෝෂණය කිරීමට අප කටයුතු කර තිබෙනවා. එම සම්බන්ධතාවය දිගින් දිගටම වර්ධනය වී හා ශක්තිමත් වී තිබෙනවා.,, වැනි මහා පරිමාණ ද්වීපාර්ශවීහ හමුදා අභ්‍යාස සහ මෙවැනි සිදුවීම් හරහා අප එකට එක්වී තොරතුරු හා අදහස් බෙදාහදාගැනීම සමගින් අපට වඩාත් ශක්තිමත් හා ප්‍රත්‍යස්ථ ශ්‍රී ලංකාවක්, තම ස්වෛරීත්වය ආරක්ෂා කරගත හැකි, ශ්‍රී ලාංකිකයින් සියළුදෙනාටම සෞභාග්‍ය උදාකරදීමට හැකි ශක්තිමත් ආයතන සංවර්ධනය කරගත් ශ්‍රී ලංකාවක් නැගී එනු දකින්නට හැකිවේය කියා මා සිතනවා.

ස්වෛරීත්වය ගැන කථා කිරීමෙන් මා අදහස් කරන්නේ ගරුත්වය ගැනයි. එක්සත් ජනපදය ඒ දැක්ම, එනම් ගරුත්වය, යථාර්ථයක් කරගන්නට අපේ මිත්‍රසගයින් සහ හවුල්කරුවන් සමගින් දීර්ඝකාලීනව වැඩකරන්නට සූදානමින් පසු වනවා. ඉන්දු-ශාන්තිකරයේ බොහෝ රටවල් සහ පුද්ගලයින් මේ කලාපය සම්බන්ධයෙන් අපට ඇති ඒ දැක්ම සහිත අය වනවා. අප සියළුදෙනා එක්ව වැඩකිරීමෙන් වඩාත් යහපත් අනාගතයක් ගොඩනංවාගන්නට අපට පුළුවනි.

අපගේ හවුල්කරුවන් සමඟ එක්ව කටයුතු කිරීමෙන් ඉන්දු ශාන්තිකර කලාපයේ සියලුම රටවල් සහ ප්‍රජාවන් සඳහා සමෘද්ධිමත් සහ සුරක්ෂිත අනාගතයක් සහතික කළ හැකි බව එක්සත් ජනපදය දන්නවා. ඉන්දු ශාන්තිකර කලාපයේ ඓතිහාසික අභියෝග ආමන්ත්‍රණය කිරීමට සහ 21 වැනි සියවසේ අවස්ථාවන් ප්‍රයෝජනයට ගැනීමට අප එක්සත් වීම ඉතා වැදගත් වේ.

The United States knows that by working together with our partners, we can together ensure a prosperous and secure future for all countries and communities in the Indo-Pacific. It is critical that we unite to address the Indo-Pacific's historic challenges and seize the opportunities of the 21st century.

Before I close my remarks I'd like to say how pleased I am to be joined here today in offering remarks by two very distinguished colleagues, Major General Milinda Peiris, KDU's Vice Chancellor who has been a driving force behind organizing this event, and Rear Admiral (retired) Peter Gumataotao, Director of the Director of the Daniel K. Inouye Asia-Pacific Center for Security Studies. DKI-APCSS has provided training opportunities to hundreds of members of Sri Lanka's security personnel, and in doing so played an important role in our strong security partnership.

I opened my remarks by saying that we share a common vision for the Indo-Pacific. It's a vision of respect and shared values. I hope that these remarks have outlined that vision and, perhaps most importantly, shared some ideas about what a partnership for a Free and Open, Prosperous, Connected, Resilient, and Secure Indo-Pacific can achieve.

Here's to the next 75 years of our work together focused on People, Progress, and Partnership.

Thank you.